**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ආණ්ඩුකරණයට වගකිවයුත්තන් දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1. ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රු.10,800,000,000 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි රජයේ මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් තක්සේරු කිරීම සඳහා වන 2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මාර්ගෝපදේශ ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් 2023 සැප්තැම්බර් 07 දිනැති ලිපිය මගින් නව තක්සේරු වාර්තාවක් ඉල්ලුම් කර ඇත. එම වාර්තාව ලද පසුව සංශෝධිත වටිනාකම අනුව ගිණුම්ගත කිරීම සිදු කරනු ලැබේ. | ගිණුම් පිළියෙල කිරීමේදී චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු වන බව. |
| (ii) | 2023 දෙසැම්බර් 06 දිනැති අංක අමප/23/2229/620/032-11 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව සියවස් දෙකකට පෙර නෙදර්ලන්තයට රැගෙන ගිය මහනුවර රාජධානි සමයට අයත් කෞතුක භාණ්ඩ 06 නැවත ශ්‍රී ලංකාවට භාරදීමේදී එය රු.2,019,460,000 කට තක්සේරු කර විදේශ ප්‍රදානයක් ලෙස සලකා මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර තිබුණි. | නෙදර්ලන්ත රජය විසින් නැවත ශ්‍රී ලංකාවට භාරදුන් කෞතුක භාණ්ඩවල තක්සේරු වටිනාකම ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට භාණ්ඩාගාරය විසින් තීරණය කොට ඒ සඳහා ප්‍රතිපාදන සලසා දෙන ලදී. එසේම, භාණ්ඩාගාරය විසින් එම ගිණුම්ගත කිරීමද සිදුකරන ලදී. | ලංකාවෙන් පැහැරගෙන ගිය කෞතුක භාණ්ඩ විදේශ ප්‍රදානයක් ලෙසට සැලකිය නොහැකි බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1. වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුනරාවර්තන වැය විෂයයක් සඳහා ප්‍රතිපාදිත රු.1,770,000 කින් රු.1,564,437 ක් ඉතිරි වී තිබූ අතර, එම ඉතිරිය අනුමත ප්‍රතිපාදනයෙන් සියයට 88 ක් විය. | වාහනය කුළියට ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කර ප්‍රසම්පාදන තීරණය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා ගැනීමට අමාත්‍යාංශය වෙත යොමු කළද අමාත්‍යාංශය භාවිත කළ පැරණි වාහනයක් දෙපාර්තමේන්තුවට ලබා දෙන ලද බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු බව. |

### 2.2. බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 94 (1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් හා බැරකම් ඇතිකර නොගත යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 03 ක් සඳහා රු.68,572 ක් වූ ප්‍රතිපාදන ඉතිරිකිරීම් ඉක්මවා රු.700,025 ක බැරකම් වලට එළඹී තිබීම හේතුවෙන් ඉතිරිය ඉක්ම වූ බැරකම්වල වටිනාකම රු.631,453 ක් විය. | 2022 වර්ෂයේ සැලසුම් නොකළ පරිදි 2023 ජාතික නිදහස් දින උත්සවය, ජාතික වෙසක් උත්සවය, ජංගම ප්‍රදර්ශන, නැදුන්ගමුව හස්තියා නිර්මාණය කිරීම, හා නෙදර්ලන්ත රජයේ රිස්ක් කෞතුකාගාරයේ තැන්පත් කර තිබූ ශ්‍රී ලංකාවට අයත් මහනුවර රාජධානි සමයේ පැහැර ගත් කෞතුක භාණ්ඩ 06ක් නැවත ශ්‍රී ලංකාවට භාර දීම වැනි උත්සව හදිසියේ සංවිධානය කිරීමට සිදු වීම හේතුවෙන් අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ද බොහොමයක් පැවති බැවින්, සිටින සේවකයන් යොදවා අතිකාල ගෙවීමට සිදුවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිකිරීම් ඉක්මවා බැරකම් හා බැඳීම්වලට එළඹීමට සිදු වී පැවති බව දන්වා තිබුණි. | ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවා බැඳීම් හා බැරකම් ඇතිකර ගත යුතු වන බව. |

## 2.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | | |
| | XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 3.1 මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 113 (6) | 1,000,958 | 2023 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සේවකයින් 11 කගෙන් අයවිය යුතු රු.1,000,958 ක ණය මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ පොෂ්‍ය සහකාර ලේකම්ගේ අංක CA/1/1/24/2 හා 2024.03.05 දිනැති ලිපිය මඟින් එක් සේවකයෙකුගේ ණය ශේෂය වන රු. 1437.00 ක මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලැබී ඇති බව දන්වා තිබුණි. | හිඟ ණය ශේෂ අයකර ගැනීමට ක්‍රියා කළ යුතුය. |
| (ii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | මුදල් රෙගුලාසි 756 | - | 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය කෞතුකාගාර 10 හි භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. | 2022 වර්ෂයේ දී සියලු කෞතුකාගාරවල හා අංශවල නිසි පරිදි කෞතුක භාණ්ඩ සමීක්ෂණයක් සිදුකොට ඒ සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂය සඳහා කෞතුකාගාරවල සහ අංශවල කෞතුක භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කිරීමට සමීක්ෂණ මණ්ඩල පත්කර ඇති අතර, මේ වන විට අදාළ කටයුතු සිදු වෙමින් පවතී. | කෞතුක භාණ්ඩ ආරක්ෂිතව හා පහසුවෙන් භෞතිකව සමීක්ෂණය කළ හැකි ආකාරයට නවීන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වන බව. |
| (iii) | 2023 ඔක්තෝම්බර් මස 05 දිනැති අංක අමප/23/1491/620/019-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | - | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් බදු පදනම මත ලබාගෙන තිබූ ගොඩනැගිල්ල ආපසු ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත භාරදීම හා හිඟ බදු කුළිය නිරවුල් කිරීම සඳහා වූ 2023 අගෝස්තු 23 දිනැති | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් ලක්සල ආයතනය අදාළ ගොඩනැගිල්ල නවීකරණය කිරීම සඳහා වැය කළ මුදල තක්සේරු කර වාර්තාව ලබා දී ඇති බවත්, මෙම දෙපාර්තමේන්තුවට ලක්සල ආයතනයෙන් ගිවිසුම් ප්‍රකාරව අයවිය යුතු හිඟ මුදල ද ගණනය | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හිඟ බදු කුළිය ගණනය කර අයකළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| | PFD/RED/REG/CM/2023/305 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ 03 ඡේදයේ 3.1 අනු ඡේදය අනුව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | කර ඇති බවත්, ගොඩනැගිල්ල ලක්සල ආයතනය විසින් පරිහරණය කර භාරදෙන විට සිදු වී ඇති අලාභහානි සඳහා අළුත්වැඩියාවන් සිදු කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු ද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ලැබී ඇති බවත්, ඒ අනුව ලක්සල ආයතනයෙන් මෙම දෙපාර්තමේන්තුවට අය වීමට ඇති මුදල තීරණය කර නිරවුල් කිරීමට කටයුතු කෙරෙමින් පවතින බව දන්වා තිබුණි. |

**2.4. වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 ජනවාරි සිට 2022 අගෝස්තු මස දක්වා ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ ප්‍රවේශ පත්‍ර ආදායම් බැංකුගත කිරීමේදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ 2023 මැයි 31 දින ඉදිරිපත් කර ඇති මූලික විමර්ශන වාර්තා අනුව දෙපාර්තමේන්තුව වෙත අහිමි කර ඇති සමස්ථ ආදායම රු.1,652,605 ක් විය. අලෙවි කළ ප්‍රවේශ පත්‍ර ආදායම් පිළිබඳ දෛනික ලේඛන තුලනය කිරීමත්, මුදල් බැංකුගත කිරීමත් අක්‍රමිකතාවයට වගකිව යුතු ස්ථානභාර නිලධාරියා විසින් සිදුකර තිබුණු අතර, මුදල් රෙගුලාසි 177 (1) ප්‍රකාරව මුදල් දෛනිකව බැංකුගත කර නොතිබුණි. එසේ වුවද, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාර පරීක්ෂණයෙන් පසු අලාභය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළතදී ඉදිරිපත් කළ යුතු පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමටත්, අලාභය පිළිබඳව මුදල් රෙගුලාසි 103 (1) (ඉ) හා 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයේ සටහන් යොදා යාවත්කාලීන කිරීමටත් කටයුතු කර නොතිබුණි. | ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ ප්‍රවේශපත්‍ර ආදායම බැංකුගත කිරීමේදී සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතාවයේ අලාභය පිළිබඳ මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ඇතුළත් කමිටුවක් මඟින් පරීක්ෂාවක් සිදු කරන ලදී. ඒ අනුව, සිදුව ඇති අලාභය රු. 1,652,605.00 කි. එම මුදල ගෙවන ලෙස 2024.05.06 දිනැති ලිපියෙන් අදාළ නිලධාරියා දැනුවත් කර ඇත. මීට අමතරව, ගාල්ල පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් දමා ඇති අතර, ඒ අනුව නඩු පැවරීමට කටයුතු කෙරෙමින් පවතී. තවද, අදාළ නිලධාරියාට එරෙහිව විධිමත් විනය පරීක්ෂණ ආරම්භ කර ඇති අතර, මු.රෙ.104 අනුව කටයුතු කිරීම ආරම්භ කර බව දන්වා තිබුණි. | වැරදි හා වංචා ඇති නොවන ආකාරයට අභ්‍යන්තර පාලනය සකස් කර යාවත්කාලීන කළ යුතු වන බව හා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1. දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් 2023 දෙසැම්බර් මස දක්වාත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ කෞතුකාගාර පද්ධතියම නියාමනය කිරීමේ අධිකාරී බලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පවත්නා නීතියට අදාළ සංශෝධනයන් කර කෞතුකාගාර ක්ෂේත්‍රයේ නියාමන බලය ලැබිය යුතු ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත එම බලය ලබා ගැනීමට ද ක්‍රියා කර නොතිබුණි. | කෞතුකාගාර සඳහා එවැනි පිළිගත් මාර්ගෝපදේශ සංග්‍රහයක් නොමැති අතර, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ කෞතුක භාණ්ඩ කළමනාකරණය (Collection Management) කිරීම සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස් කොට ඇති බව දන්වා තිබුණි. | කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම හා සමස්ථ කෞතුකාගාර පද්ධතිය නියාමනය කිරීමේ අධිකාරී බලය ලැබෙන පරිදි පවත්නා නීතිය සංශෝධනය කළ යුතු වන බව. |
| (ආ) ශ්‍රී ලංකාවේ ජාතික කෞතුකාගාර හා කෞතුක භාණ්ඩ සම්බන්ධයෙන් රටට ගැළපෙන අකාරයට අදාළ වන ප්‍රමිති හා මාර්ගෝපදේශ සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | කෞතුකාගාර හා කෞතුක භාණ්ඩ සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් දෙස විමසන විට කෞතුකාගාර විසින් අනුගමනය කරනුයේ **ICOM** ප්‍රමිතීන් වේ. සාමාජික රටක් ලෙස අප ද අනුගමනය කරනුයේ ජාතික කෞතුකාගාර කවුන්සිලය **(ICOM)** විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන් බව දන්වා තිබුණි. | රටට ගැළපෙන පරිදි කෞතුක භාණ්ඩ සම්බන්ධයෙන් වන ප්‍රමිත හා මාර්ගෝපදේශ සකස් කළ යුතු වන බව. |

### 3.2. ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාර පුස්තකාලය වෙනුවෙන් ගිණි ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා 2021 ජනවාරි 01 දින රු.98,550,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ආරම්භ කර තිබූ ව්‍යාපෘතියේ වැඩ 2022 මාර්තු 31 දින අවසන් කළ යුතු වුවද, 2024 අප්‍රේල් මස වන විටත් එහි වැඩ අවසන් කර නොතිබුණු අතර, 2023 දෙසැම්බර් 31 දිනට එහි මූල්‍ය වියදම රු.43,153,409 ක් විය. | කොළඹ ජාතික කෞතුකාගාරයේ පුස්තකාලය ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ කොන්ත්‍රාත්තුව පිරි නැමූ කොන්ත්‍රාත් ආයතනයේ දුර්වල කාර්ය සාධනය මත කොන්ත්‍රාත්තුව අවලංගු කර බැඳුම්කර අය කර ගන්නා ලදී. | ගිණි ආරක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීම කඩිනමින් අවසන් කළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| | ඉතිරි කාර්යයන් සඳහා නව මිල ගණන් කැඳවා Thudawe Engineering Service නමැති ආයතනය වෙත 2023 දෙසැම්බර් 18 දින කොන්ත්‍රාත්තුව පවරා ඇත. එම කාර්යය 2024 ජුනි 15 දින වන විට අවසන් වීමට නියමිතය. | |

### 3.3. ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 17 දිනැති අංක PED/e-GP/Circular/2018 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය සහ 2018 ඔක්තෝම්බර් 23 දිනැති අංක PED/e-GP/Circular/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදනයන් සිදුකිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදනයන් විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදයකට සකස් කිරීමට අදාළව නිලධාරීන් පුහුණු කිරීම සිදු කර ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරගෙන යන අතර, 2024.05.31 දින වන විට ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් ක්‍රමවේදය ඔස්සේ සිදු කිරීම ආරම්භ කිරීමට සැලසුම් කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු සිදුකළ යුතු වන බව. |

### 3.4. වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ජෛව විද්‍යා මැදිරියට යාබදව පවතින දෙවන මහලේ වම් පස කොටස මුළුමනින්ම වසා දමා 2012 වසරේ සිට මේ දක්වා මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කර තිබුණු අතර, අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට හෝ ඵලදායී වෙනත් කාර්යයකට මෙම කොටස භාවිතා කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි. | ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ජෛව විද්‍යා මැදිරියට යාබදව පවතින දෙවන මහලේ වම් පස කොටස අළුත්වැඩියා කර ප්‍රදර්ශන මැදිරි සකස් කිරීම සඳහා පසුගිය වසර කිහිපයකදීම සැලසුම් කර තිබුණ ද, අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගත නොහැකි වීමෙන් එම සැලසුම් මේ දක්වා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත්, සුළු අළුත්වැඩියාවක් සිදු කර 2023 | සම්පත් වලින් උපරිම ප්‍රයෝජනය ගත යුතු වන බව. |

| | | |
|---|---|---|
| | වසරේ සිට තාවකාලික ප්‍රදර්ශන සඳහා එම කොටස් භාවිත කරනු ලබයි. මෙම කෞතුකාගාරයට සකස් කරන ලද ප්‍රධාන සැලැස්මට අනුව ඉදිරියේදී මෙම කොටසට අදාළ ස්ථිර ප්‍රදර්ශන සකස් කිරීමට නියමිතව ඇති බව දන්වා තිබුණි. | |
| (ආ) දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන ප්‍රාදේශීය කෞතුකාගාර 11 හි හා දෙපාර්තමේන්තු ගබඩාවල පවතින සමස්ථ කෞතුක වස්තූන් පිළිගත් නිසි ක්‍රමවේදයක් සකස් කර තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ජාත්‍යන්තර වශයෙන් කෞතුක භාණ්ඩ තක්සේරු කිරීම සඳහා පිළිගත් ක්‍රමෝපායන් නොමැත. කෞතුකාගාරවල කෞතුක භාණ්ඩ නිසි පරිදි ලේඛනගත කොට පවත්වාගෙන යාම පමණක් සිදු කරනු ලැබේ. එහෙත්, කෞතුක භාණ්ඩ තිබෙන ස්ථානයක සිට විදේශ රටකට ගෙන යාමේදී ඒවා රක්ෂණය කිරීම සඳහා පමණක් දළ තක්සේරුවක් සිදු කරනු ලබයි. දේශීය වශයෙන් කෞතුක භාණ්ඩ තක්සේරු කිරීමේ ක්‍රමයක් සකස් කරන්නේ නම් ඒ අනුව, මේ සම්බන්ධයෙන් ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවට ද කටයුතු කළ හැකිවනු ඇත. | කෞතුක වස්තූන් පිළිගත් ක්‍රමවේදයකට අනුව තක්සේරු කළ යුතු වන බව. |

## 3.5. පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.4,440,140 ක් වූ කෞතුක භාණ්ඩ 221 ක් සොරකම් කිරීම සිදුවී 2023 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 11 ක කාලයක් ගතවී පැවති නමුත්, අවසන් තීරණය ලබාදීමට අවශ්‍ය නෛතික | කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ කෞතුක භාණ්ඩ සොරකම නිසා සිදු වූ පාඩුව හඳුනා ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් කමිටුවක් පත් කරන ලද අතර, දැනට අපරාධ පරීක්ෂණ | අදාළ නෛතික කටයුතු අවසන් කිරීම කඩිනම් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කාර්යයන් සහ එහි සමස්ථ පාඩුව හඳුනාගෙන ඊට අදාළව මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කිරීම කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව මඟින් හමු වී ඇති භාණ්ඩ සඳහා මුද්‍රා තබා ඇත. නඩු කටයුතු අවසන් වන තෙක් එම භාණ්ඩවල මුද්‍රා ඉවත්කොට, ඒවා නිරාවරණය කර ගැනීමට නොහැකි බැවින් ඒ පිළිබඳව මුදල් රෙගුලාසි අනුව නෛතික කාර්යයන් ඉටු කළ නොහැකි බව අදාළ කමිටුව විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත වාර්තා කර ඇති බව දන්වා තිබුණි. | |
| (ආ)2022 වර්ෂයට අදාළව සිදුකරන ලද කෞතුක භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව වර්ෂ 1877 සිට 1957 දක්වා කාලයට අදාළ කෞතුක භාණ්ඩ වර්ග 07 කට අයත් භාණ්ඩ 7,157 ක් අස්ථානගත වී ඇති අතර, ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් සකස් කොට අස්ථානගත වූ කෞතුක භාණ්ඩ පොතෙන් කපා හැරීමේ නියෝග ලබා ගැනීම සඳහා 2024.04.24 දින අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කළ යුතු වන බව හා මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු සිදුකළ යුතු වන බව. |

## 3.6. කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා අංශයේ මැණික් ගල් 272 ක් ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ 1964 සැප්තැම්බර් 18 දින සිට තැන්පත් කර පැවති අතර, 1993 වර්ෂයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී එයින් එක් මැණික් ගලක් කෘතිම ගලක් ලෙසට අනාවරණය වීමෙන් පසුව එම ගල භූ විද්‍යා අංශයේ තැන්පත් කර පැවතුණි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්න විද්‍යාඥයෙකුගේ සහාය ලබාගෙන මෙම ඉතිරි මැණික් ගල් 271 හි වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | මැණික් ගල් එකතුවේ වටිනාකම තක්සේරු කිරීම සඳහා මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය වෙත ලිඛිතව දන්වා ඇති අතර, ඔවුන් විසින් එම මැණික් ගල් පරීක්ෂාව හා තක්සේරුව අදාළ බැංකු පරිශ්‍රයේ සිදු කළ නොහැකි බවත්, ඒවා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රසායනාගාර වෙත යොමු කළ යුතු බවත් දන්වා ඇත. එසේම, මේ පිළිබඳව දෙපාර්තමේන්තු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා | වර්තමාන මූල්‍යා වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| | කළ අතර, භාණ්ඩාගාර නියෝජිත මෙම ද්‍රව්‍ය තක්සේරුව සඳහා බාහිර ආයතනයකට භාර දීම නුසුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | |
| (ආ) 2022 වර්ෂයට සාපේක්ෂව 2023 වර්ෂය තුළදී කෞතුකාගාර ආදායම් උත්පාදනය ඉහළ මට්ටමකට ගෙන ඒමට දෙපාර්තමේන්තුව කටයුතු කර පැවති නමුත් ඉතිහාසය, පුරාවිද්‍යාව හා ජාතික උරුමයන් යටතේ ජාතික වටිනාකමක් සහිත ස්ථාන නැරඹීම සඳහා පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන් සඳහා අවශ්‍ය මනා සේවයක් ලබාදීම සඳහා කෞතුකාගාර සේවකයින් පුහුණු කිරීම, සනීපාරක්ෂක පහසුකම්, විවේක ස්ථාන, ආපනශාලා වැනි මූලික පහසුකම් කෞතුකාගාර පරිශ්‍රය තුළ වැඩිදියුණු කිරීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි. | යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා විවිධ වැඩසටහන් යටතේ ප්‍රතිපාදන සලසා ගැනීමට භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළද, ලබා දෙන ප්‍රතිපාදන සීමා කිරීම නිසා ඉතා හදිසි හා වැදගත් කරුණු සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට සිදු වූ බව දන්වා තිබුණි. | දෙස් විදෙස් සංචාරකයින් සඳහා යටිතල පහසුකම් වැඩිදියුණු කළ යුතු වන බව. |
| (ඇ) 2023 දෙසැම්බර් 31 දිනට කොළඹ හා මහනුවර කෞතුකාගාර වල හැර සෙසු කෞතුකාගාර 09 හි **CCTV** කැමරා පද්ධතීන් සවි කර නොතිබීම හේතුවෙන් කෞතුක භාණ්ඩ අනාරක්ෂිතව පැවති බව නිරීක්ෂණය විය. | ප්‍රමුඛතා ලැයිස්තුව මත අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාරවල ද මෙම **CCTV** කැමරා පද්ධති ක්‍රියාත්මක කිරීමට නියමිත බව දන්වා තිබුණි. | කෞතුක භාණ්ඩවල ආරක්ෂාව තහවුරු කළ යුතු වන බව. |
| (ඈ) 2019 අගෝස්තු 01 දින ආරම්භ කර 2020 මැයි 01 දින අවසන් කළ යුතුව තිබුණු පිටකොටුව ඕලන්ද කෞතුකාගාරයේ සංරක්ෂණමය අළුත්වැඩියාව, කාලය දීර්ඝ කිරීම් අවස්ථා 02 ක් ලබාදීමෙන් අනතුරුව 2021 නොවැම්බර් 30 දින අවසන් කළ යුතු වුවද, ඒ සඳහා 2022 සැප්තැම්බර් මස දක්වා කල්ගත කිරීම මත දෛනිකව සියයට 0.05 ක් බැගින් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව අයකර ගත යුතු ප්‍රමාද ගාස්තුව ගණනය කර | පිටකොටුව ඕලන්ද කෞතුකාගාර ගොඩනැගිල්ලේ සංරක්ෂණමය අළුත්වැඩියාවට අදාළව අවසාන බිල්පත රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් මේ වන තුරු ඉදිරිපත් කර නැත. එබැවින් 0.05% ක ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සිදු කර ගත නොහැකි වී තිබේ. එසේම, මෙම ව්‍යාපෘතියේ කරන ලද වැඩවලින් රු. | කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 5,129,564.59ක මුදලක් රඳවාගෙන ඇති අතර, එම මුදලින් ප්‍රමාද ගාස්තු අය කර ගැනීම සඳහා ඉංජිනේරු ආයතනය වන ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවට අදාළ ගණනය කිරීම් සිදු කරන ලෙස දන්වා ඇත. | |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 391 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 175 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව විධායක මට්ටමේ තනතුරු 16 න් තනතුරු 07 ක් සහ තෘතියික මට්ටමේ තනතුරු 05 න් 04 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 119 කින්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 45 කින්ද සමන්විත වූ අතර, එය දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ආකාරයට බලපා තිබුණි. තවද, පුරප්පාඩු තුළ වසර 11 කටත් වැඩි කාලයක සිට පුරප්පාඩුවී පවතින, ඉතා වගකීම් සහගත කාර්යභාරයක් ඉටු කරන දෙපාර්තමේන්තුගත ප්‍රධාන ආරක්ෂක නිලධාරී තනතුරද විය. | මේ වන විට ප්‍රාථමික මට්ටමේ තනතුරු 92ක් සඳහා බහුකාර්ය සංවර්ධන සහායක නිලධාරීන් බඳවාගෙන ඇති අතර, තෘතීය මට්ටමේ පුරප්පාඩුවලින් එකක් වන පරිපාලන නිලධාරී පුරප්පාඩුව සම්පූර්ණ වී ඇත. තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙතින් අනුමැතිය ලැබී නොමැති හෙයින් නැවතත් බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇතත්, මෙතෙක් පිළිතුරු ලැබී නොමැති බව දන්වා තිබුණි. | අත්‍යවශ්‍ය සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික කෞතුකාගාරයේ කෞතුක භාණ්ඩ පිළිබඳ මහජන අවබෝධය ලබාදීම සඳහා ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් නොමැති වීමත්, කීට විද්‍යා අංශය, සත්ත්ව විද්‍යා අංශය, උද්භිද විද්‍යා අංශය සහ භූ විද්‍යා අංශය වැනි ස්වභාවික විද්‍යා අංශ වල පවතින පර්යේෂණ සඳහා යොදා ගනු ලබන කෞතුක භාණ්ඩ එකතුව නඩත්තු කිරීම, ලේඛනගත කිරීම, ගබඩා කිරීම සහ නව අයිතම රැස් කිරීම වැනි කටයුතු සඳහා ප්‍රමාණවත් සේවක පිරිසක් යොදවා නොතිබීමත් හේතුවෙන් එම අංශ වල කටයුතු පවත්වාගෙන යාම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරියේදී රාජ්‍ය සේවයේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ අනුව අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මෙම සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යසාධනය ඉහළ නැවීමට ක්‍රියා කළ යුතු වන බව. |